# ජී.එස්.පී ප්ලස් සහනය අහිමිවීමට රජය කිසිවිටකත් ඉඩ තබන්නේ නෑ

## ඇමැති මිලින්ද මොරගොඩ කියයි





ඇමැති මිලින්ද මොරගොඩ මහතා ඇඟලුම් සේවිකාවන් දැනුම්වත් කරමින්...

යුරෝපා ප්‍රජාවෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ජී.එස්.පී. ප්ලස් බදු සහනය අහිමි වීමට රජය ඉඩ තබන්නේ නැතැයි අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කළේය.

අමාත්‍ය මොරගොඩ මහතා එම ප්‍රකාශය කළේ පාදුක්ක ස්පෙන්සර් ඩෙනිම් ගාමන්ට් ආයතනයේ සේවක සේවිකාවන් සමග පැවැත්වූ විශේෂ හමුවකදීය.

එහි දී තව දුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා ජී.එස්.පී. ප්ලස් බදු සහනය ශ්‍රී ලංකාවට තව දුරටත් ලබා ගන්නට සිදු කරන ලද සාකච්ඡා සාර්ථක තත්ත්වයක පවත්නා නිසා ඒ ගැන සුබදායක බලාපොරොත්තු තබාගත හැකි බව ද පැවැසීය.

තිස් වසරක යුද්ධයෙන් පසු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් රට ගොඩ නැංවීමට අවස්ථාව ලැබී ඇති බැවින් ඒ ස්වර්ණමය අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට රජයට ශක්තිමත් ජන වරමක් අවශ්‍ය බව වැඩි දුරටත් අවධාරණය කළේය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය පවත්වාගෙන යාමට ඇඟළුම් කම්හල් සේවක සේවිකාවන් ලබා දෙන සහාය ඉතා අගය කරන බව සඳහන් කළ මොරගොඩ මහතා ඇඟළුම් කර්මාන්තයේ අනාගතය සම්බන්ධව කිසිදු අනියත බියක් ඇති කර නොගත යුතු බවත් පැවැසීය. අපගේ අනන්‍යතාව රැකෙන ශ්‍රී ලාංකික භාණ්ඩ නිෂ්පාදනය මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වන මෙන් ඔහු ඇඟළුම් කම්හල් සේවක පිරිසගෙන් ඉල්ලීමක් කරනු ලැබීය.

මේ අවස්ථාවට ශ්‍රී ලංකා ජාතික සංගමයේ මහ ලේකම් ආර්.ඒ.ඩී. සිරිසේන මහතා ද ස්පෙන්සර් ඩෙනිම් ගාමන්ට් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ දයානන්ද සිල්වා මහතා ද එක්ව සිටියහ.

(රන්ජිත් ආනන්ද ජයසිංහ)